සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 7 - 2017

**නම : ............................................... ක්‍රිස්තු ධර්මය කාලය : පැය 2යි.**

## I කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) නෝවාගේ කාලයේ මිනිස් සමාජය දූෂණය වූයේ,
(i) සුනාමියෙන් ය. (ii) ජල ගැලීමෙන් ය.
(iii) නියගයෙන් ය. (iv) නායයෑමෙන් ය.

(2) දෙවිඳුන්ගේ තිරසර ප්‍රේමයෙන් අප ලද වටිනාකමකි,
(i) අන් අය පාපයෙන් මුදවා ගැනීම. (ii) ආත්මාර්ථයෙන් ජීවත්වීම.
(iii) සමාජයට වෛර කිරීම. (iv) අන් අය පාපයට නැඹුරු කිරීම.

(3) ''පියාණෙනි ඔවුන්ට කමා වුව මැනව,ඔවුන් කරන දේ ඔවුහු නොදනිති''. මෙම ප්‍රකාශය ජේසුස් වහන්සේ කුරුසියේදී පැවසූ
(i) දෙවන වචනයයි. (ii) හයවන වචනයයි.
(iii) තෙවන වචනයයි. (iv) පළමු වචනයයි.

(4) සැඩ සුලඟක් හමන්නාක් මෙන් හඬක් / ගිනි දලු වැනි දිව් / අන්‍ය භාෂාවලින් කථා කිරීම මෙලෙස විස්තර කරන්නේ කුමන මංගල්‍යයක් පිළිබඳවද?
(i) පාස්කු මංගල්‍යය. (ii) පෙන්තකොස්ත මංගල්‍යය.
(iii) ඉරු දින මංගල්‍යය. (iv) විවාහ මංගල්‍යය.

(5) ළමුන්ගේ ආරක්ෂාව සැපයීම වෙනුවෙන් වෙන් වූ දුරකථන අංකය කුමක්ද?
(i) 1717 (ii) 1929 (iii) 119 (iv) 1879

- **අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**
( මිනිසා, පරිසිවරුන්, ජොහන්, ජේසුස් වහන්සේ, පේදුරු )

(6) ගෝලයින්ගේ පාද සෝදන අවස්ථාවේ ඊට අකමැති වූ ගෝලයා වන්නේ .................................... ය.

(7) ජේසුස් වහන්සේ වඩාත් ප්‍රේම කළ ගෝලයා වන්නේ .......................................... ය.

(8) 'පොළොං වංශය' කියා ජේසුස් වහන්සේ ආමන්ත්‍රණය කළේ ..................................ට ය.

(9) දේව මැවිල්ලේ ප්‍රධාන තැන හිමිවන්නේ ................................... ට ය.

(10) කුමක් කමුද කියා ජීවිතය ගැනවත් , කුමක් අඳිමුද කියා ශරීරය ගැනවත් අප කරදර නොවිය යුතු බව පෙන්වා දුන්නේ ......................................... ය.

v **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල දක්වෙන ප්‍රකාශ හරි නම් (3) ලකුණද වැරදි නම් (8) ලකුණද යොදන්න.**

(11) වන මී, පළගැටියන් ආහාරයට ගත්තේ ස්නාවක ජොහාන් තුමා ය. ( )

(12) ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ බව අවිශ්වාස කළ ගෝලයා පේදුරුතුමා ය. ( )

(13) සුදර්ශන දොරටුව අසලදී සුවය ලැබූයේ කොර වී සිටි අයෙකි. ( )

(14) අපට පරීක්ෂාවක් පැමිණි විටදී අප කිතුණුවකු වශයෙන් කළ යුත්තේ කෑ ගසා හඬා වැලපීමයි.( )

(15) අප දේව මැව්ල්ල සුරැකීමේ වගකීම භාරගත යුතුය. ( )

v **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට A කොටසේ වගන්ති හා ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A කොටස | B කොටස |
|---|---|---|
| (16) | පෙරමග දූතයා යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන්නේ | පේදුරු ය. |
| (17) | රන්වත් රිදී වත් මට නැත.එහෙත් මට ඇති දේ නුඹට දෙමි ප්‍රකාශ කළේ | තුනකි. |
| (18) | කිතුණු ජීවිතයේ පදනම | ජේසුස් වහන්සේ ය. |
| (19) | ජේසු තුමාට පැමිණි පරීක්ෂා ගණන | ස්නාවක ජොහාන්තුමා ය. |
| (20) | අන්න මා පාවා දෙන්නා අත ළඟය කීවේ | ඇදහිල්ලයි. |

( ලකුණු 2x 20 = 40 )

# II කොටස

V පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(1) (i) දෙවියන් වහන්සේ ලෝකය මවා මිනිසාට භාර දී ලබා දුන් වගකීම් දෙකක් ලියන්න?
(ii) ස්නාවක ජොහාන්තුමාගේ මව හා පියා නම් කරන්න.
(iii) ජේසුස් වහන්සේ දින 40ක් පාළුකරයේ වෙසෙමින් කළේ කුමක්ද?
(iv) ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා යොදා ගත් ස්ථාන දෙකක් ලියන්න.
(v) බයිබලයේ සඳහන් 'රන් අණ' ලියන්න.
(vi) ජේසුස් වහන්සේ කුරුසිපත් වීමට පෙර ඊට ආසන්නව සිදු වූ විශේෂ සිදුවීම් දෙකක් ලියන්න.
(vii) පෙන්තකොස්ත දින සිද්ධිය සඳහන් වන්නේ බයිබලයේ කුමන පොතේ ද?
(viii) ''නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න'' මෙසේ ප්‍රකාශ කලේ කවුද?කාට ද?

( ලකුණු 2 x 8 = 16 )

(2) (i) අද සමාජය තුළ දරුවන්ට එල්ල වන පීඩා දෙකක් ලියන්න. ( ලකුණු 2 )
(ii) ළමා අයිතීන් සුරැකීමට ඇති ආයතන තුනක් ලියන්න. ( ලකුණු 3 )
(iii) කිතුණු දරුවෙකු ලෙස ඔබ ඔබේ මිතුරා / මිතුරියගේ ආරක්ෂාව වෙනුවෙන් සිදු කරන දේවල් තුනක් ලියන්න. ( ලකුණු 6 )

(3) (i) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා අතුරින් දෙකක් ලියන්න. ( ලකුණු 2 )
(ii) එම පරීක්ෂාවලට ජේසුස් වහන්සේ ලබා දුන් පිළිතුරු ලියන්න. ( ලකුණු 3 )
(iii) කිතුණුවකු ලෙස ඔබට එල්ල වන පරීක්ෂා තුනක් සඳහන් කර ඔබ ඒවාට මුහුණ දෙන ආකාරය ලියන්න. ( ලකුණු 6 )

(4) (i) ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේදී තම ශරීරය හා රුධිරය සමාන කළේ මොනවාට ද? ( ලකුණු 2 )
(ii) ගෝලයින්ගේ පාද සෝදන අවස්ථාවේ ඊට අකමැති වු ගෝලයා නම් කර ජේසුස් වහන්සේ ඒ තුළින් අපට පෙන්වා දුන් ආදර්ශ දෙකක් ලියන්න. ( ලකුණු 3 )
(iii) 'නිරතුරුවම අප දේව කැමැත්තට අවනත විය යුතුය'. යන්න ගෙත්සෙමනේ යාච්ඤාව තුළින් අපිට පසක් වේ. ජේසුස් වහන්සේ සිදු කළ එම යාච්ඤාව කුමක් ද? ( ලකුණු 6 )

(5) (i) ජුදෙව් පාස්කුවට දින කීයකට පසු පෙන්තකොස්ත මංගල්‍යය සිදු වීද? ( ලකුණු 02 )
(ii) පෙන්තකොස්ත දින සිදුවීම කෙටියෙන් පැහැදිලි කරන්න? ( ලකුණු 03 )
(iii) ශුද්ධාත්ම මග පෙන්වීම අයදිමින් කෙටි යාච්ඤාවක් ලියන්න. ( ලකුණු 06 )

(6) (i) ජේසුස් වහන්සේ ඉගැන්වූ ස්වාමින්ගේ යාච්ඤාවේ කමා වීම පිළිබඳ ඇති වදන් ලියන්න. ( ලකුණු 02 )
(ii) ඔබේ පංතියේ මිතුරෙකුට / මිතුරියකට ඔබට කළ හැකි උපකාර තුනක් ලියන්න. ( ලකුණු 03 )
(iii) ඔබට සතුරුකම් කරන අය උදෙසා ඔබ කරන දේවල් තුනක් ලියන්න. ( ලකුණු 06 )

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017
# Second Term Test - Grade 7 - 2017

## ක්‍රිස්තු ධර්මය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (6) | පේදුරු | 11 | 3 | 16 | ස්නාවක ජොහාන්තුමා |
| (2) | 1 | (7) | ජොහාන් | 12 | 8 | 17 | පේදුරු |
| (3) | 4 | (8) | පරිසිවරුන් | 13 | 3 | 18 | ඇඳහිල්ල |
| (4) | 2 | (9) | මිනිසා | 14 | 8 | 19 | තුනකි |
| (5) | 2 | (10) | ජේසුස් වහන්සේ | 15 | 3 | 20 | ජේසුස් වහන්සේ |

(ලකුණු 2 x 20 = 40 )

## II කොටස

(1) (i)
- දරු සම්පත් ලැබීම.
- පොළව පුරා පැතිර එය පාලනය කිරීම.
- සතුන් ආරක්ෂා කිරීම.
- භූමිය රැකගෙන එය වගා කිරීම.
- මැවිල්ලෙන් නිසි ප්‍රයෝජන ගැනීම.

(ii) සෙකරියස් හා එලිසබෙත්

(iii) නිරාහාරව යාච්ඤා කළා

(iv)
- කඳු මුදුන්
- මිටියාවත්
- මුහුදු වෙරළ

(v) අනුන් ඔබට යමක් කරනවාට කැමතිද?
ඔබත් ඔවුන්ට ඒ දේම කරන්න.

(vi)
- අන්තිම රාත්‍රී භෝජනය
- ශ්‍රාවකයින්ගේ පාද සේදීම
- ගෙත්සමනේ යාච්ඤාව

(vii) ක්‍රියා පොතේ

(viii) පේදුරු සුදර්ශන දොරටුව අසල සිටි කොරාට

(2) (i)
- දුප්පත් කම.
- විවිධ හිංසන වලට ගොදුරු වීම.
- අතවර හා අපචාර වලට මුහුණදීම.
- මව හා පියා විදේශ ගත වීම.
- ළමා මෙහෙකාරකම.
- යුද්ධ නිසා අසරණ වීම.
- දෙමාපිය සබඳතා දෙදාර යාම.
- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම.

(ii)
- ළමා හා කාන්තා කටයුතු අමාත්‍යංශය.
- ශ්‍රී ලංකා පොලිස් ළමා හා කාන්තා කාර්යංශය
- පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව
- එක්සත් ජාතීන්ගේ ළමා රක්ෂණ අරමුදල
- රාජ්‍ය නොවන ස්වේච්ඡා සංවිධාන

(iii) මිතුරාට/මිතුරියට සිදුවන පීඩා පිළිබඳව දැනුවත් කිරීම ඒවාට එරෙහිව නීතිමය පියවර ගැනීම... ආදි ලියා ඇති පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න.

(3) (i) ගල් ගෙඩිය පාන් ගෙඩියක් වීමට අණ කිරීම.
ලෝකයේ සියලු රට රාජ්‍ය පෙන්වා ඒ සියල්ල ලබා දෙමි යක්ෂයාට නමස්කාර කරන්න.
ජෙරුසලමේ දේව මාලිගාවේ කොත මුදුනට ගෙන ගොස් එතනින් පහළට පනින්න.

(ii) මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේය. නුඹේ දෙවි වන සමිදාණන් වහන්සේ නමස්කාර කරන්න. උන් වහන්සේට පමණක් සේවය කරන්න. නුඹේ දෙවි වන සමිදාණන් වහන්සේ පරීක්ෂා නොකරන්න.

(iii)
- මත්ද්‍රව්‍ය වලට ලොල් වීම.
- බලය අනිසි ලෙස භාවිතා කිරීම.
- අල්ලස් ගැනීම.

- ලෞකික දේවල් වලට ඇලුම් කිරීම.
- සොරකම් කිරීම.
- පරීක්ෂාවන්ට දේව වචනයෙන් පිළිතුරු ලබා දීම.
- එම පරීක්ෂාවන් ප්‍රතික්ෂේප කිරීම.
- යාච්ඤාවෙන් හා ඇදහිල්ලෙන් නිරතුරුව සිටීම. ආදි

(4) (i) ශරීරය - රොටී රුධිරය - මිදි යුෂ

(ii) පේදුරු. නිහතමානීකම / උස් පහත් භේදයක් නැති බව.

(iii) පියාණෙනි හැකි නම් මේ කුසලාන මගෙන් පහ කළ මැනව. එහෙත් මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවා.

(5) (i) දින 50 කට පසු

(ii) සැඩ සුළඟක් හැමීම / ගිනි දළු වැනි දිව් / අන්‍ය භාෂා වලින් කථා කිරීම ...

(iii) ලියා ඇති පිළිතුරට ලකුණු ලබාදෙන්න

(6) (i) අපට වැරදි කරන අයට අප කමා වෙන්නාක් මෙන් අපේ වැරදි වලටත් කමා වුව මැනව.

(ii) පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න

(iii) සතුරු කම් කරන අය උදෙසා යාච්ඤා කිරීම.
දේව දරුවෙකු ලෙස ලොවට ආදර්ශයක් වීම.
සතුරාට ප්‍රේම කිරීම.
සතුරාට ප්‍රති විරුද්ධව ක්‍රියා නොකිරීම.